# ජාතික ගමනාගමන කොමිෂන් සභාව.

## වලංගු මගී සේවා අවසරපත්‍රවල අයිතිය පැවරීමේ ක්‍රමවේදය.

1. ඉල්ලුම්පත්‍ර බාරදීම සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන **www.ntc.gov.lk** වෙබ් අඩවිය හරහා, වෙන්කරගත් දිනයේ පැමිණෙන පැවරුම්කරුවන්ගේ නිවැරදිව සම්පූර්ණ කර ඇති ඉල්ලුම්පත්‍ර හා 2026.අංක 01 දරන මගී සේවා අවසරපත්‍ර පැවරීමේ නියෝග සහිත ගැසට් නිවේදනයේ II වන උපලේඛනයේ සඳහන් පරිදි ඊට අදාළ ලේඛණ ජා.ග.කො.ස./ධා/අයිතිය පැවරීම පොදු ආකෘති පත්‍ර -01 ට අනුකූලව පරීක්ෂාකර බාරගැනීම සිදුකරනු ලැබේ. **ඉල්ලුම්පත්‍රය බාරදීම සඳහා අනිවාර්යයෙන් පැවරුම්කරු ජාතික ගමනාගමන කොමිෂන් සභාව වෙත පැමිණිය යුතුය**.

2. ඉල්ලුම්පත්‍ර හා ඊට අදාළ ලේඛණ ජා.ග.කො.ස./ධා/අයිතිය පැවරීම පොදු ආකෘති පත්‍ර -01 ට අනුව අසම්පූර්ණ නම් ඒවා සම්පූර්ණකර බාරදීමට එම අවස්ථාවේදීම පැවරුම්කරුට නැවත දිනයක් හා වෙලාවක් ලබාදීම සිදුකළ යුතුය.

3. අයිතිය පැවරීම සඳහා බාරගනු ලබන ඉල්ලුම්පත්‍ර සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ පූර්ව අනුමැතියට ඉදිරිපත් කිරීමේ ගාස්තුව වන රු 5000.00 ක ගාස්තුව පැවරුම්කරුවන් විසින් ජාතික ගමනාගමන කොමිෂන් සභාව වෙත ගෙවිය යුතුය.

4. අයිතිය පැවරීමට බාරගනු ලබන මගීසේවා අවසරපත්‍රය සඳහා තාවකාලික අවසරපත්‍රයක් පැවරුම්කරු වෙත නිකුත් කරනු ලැබේ.

5. අයිතිය පැවරීමේ ඉල්ලුම්පත්‍රය අධ්‍යක්ෂ මණ්ඩලයේ පූර්ව අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ (ධාවන හා සේවා අධීක්ෂණ) හා අධ්‍යක්ෂ ජනරාල් නිර්දේශ සමග සභාපතිවරයාගේ අනුමැතියට ඉදිරිපත් කළ යුතුය.

6. ඉල්ලුම්පත්‍ර සඳහා අනුමැතිය ලැබීම හෝ ප්‍රතික්ෂේප කිරීම යෝජිත පැවරුම්ලාභීන් වෙත ලිඛිතව දැනුම් දෙනු ලැබේ.

7. අනුමැතිය හිමිවූ ඉල්ලුම්පත්‍ර සඳහා, මගී සේවා අවසරපත්‍රයක් පවරාගැනීමට පැවරුම්ලාභියා විසින් ඉදිරිපත් කලයුතු ඉල්ලුම්පත්‍රය හා 2026.අංක 01 දරන මගී සේවා අවසරපත්‍ර පැවරීමේ නියෝග සහිත ගැසට් නිවේදනයේ Vවන උපලේඛනයේ සඳහන් පරිදි ඊට අදාළ ලේඛණ සහ අදාළ පැවරුම්ලාභියා නමින් **සන්තකය පවරාගෙන දින 07ක් තුලදී** එම බස්රථයද රැගෙන,අවසරපත්‍රයේ පැවරුම්කරු (වර්ථමාන හිමිකරු) ද සමග පැමිණෙන ලෙස පැවරුම්කරුට ද පිටපත් සහිතව යෝජිත පැවරුම්ලාභියා වෙත ලිඛිතව දැනුම් දීම.

8. පැවරුම්ලාභියාගේ ඉල්ලුම්පත්‍රය බාරගැනීම ජා.ග.කො.ස./ධා/අයිතිය පැවරීම පොදු ආකෘති පත්‍ර -03 ලේඛණය මගින් සභාපති/අධ්‍යක්ෂ ජනරාල් ඉදිරිපිටදී පැවරුම්කරුගේ සහ පැවරුම්ලාභියාගේ අත්සන් හා ඇඟිලි සලකුණු සහතික කිරීම සිදුකිරීමෙන් අනතුරුව සිදුකරනු ඇත. එහිදී පැවරුම්ලාභියා විසින් මගී සේවා අවසරපත්‍රයක් පැවරීමේ ඉල්ලුම්පත්‍ර ගාස්තුව වන රුපියල් 5000.00ක ගාස්තුව ජාතික ගමනාගමන කොමිෂන් සභාව වෙත ගෙවිය යුතුය.

9. ඉන් අනතුරුව පැවරුම්ලාභියා නමින් සන්තකය පවරාගෙන ලියාපදින්චි සහතිකය සමග ඉදිරිපත් කරන ලද, මගී සේවා අවසරපත්‍රයට අදාළ බස්රථයේ පිරිවිතර පරීක්ෂාව සඳහා යොමුකිරීම හා එම පිරිවිතර පරීක්ෂාවෙන් සමත්වන බස්රථ සඳහා ඔමිනි නිර්දේශ ලබාදීම සිදුකරනු ලැබේ.

10. බස්රථය සඳහා ඔමිනි ලියාපදිංචි සහතිකය ලබාගත් පසු පැවරුම්ලාභියා විසින් නව අවසරපත්‍රය ලබාගැනීමට ධාවන හා සේවා අධීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් කලින් දිනයක් වෙන්කරවාගත යුතුය.(ඔමිනි ලියාපදිංචි සහතිකය upload කිරීමෙන් පසුව දින ලබාදේ)

11. කලින් වෙන්කරවාගත් දිනයේ දී පැමිණෙන පවරුම්ලාභීන් හට සිය බස්රථයේ ඔමිනි ලියාපදිංචි සහතිකය ඉදිරිපත් කිරීමෙන් පසුව හා මගීසේවා අවසරපත්‍රයක් පැවරීමේ ගාස්තුව 2026.අංක 01 දරන මගී සේවා අවසරපත්‍ර පැවරීමේ නියෝග සහිත ගැසට් නිවේදනයේ III වන උපලේඛනයේ සඳහන් පරිදි ජාතික ගමනාගමන කොමිෂන් සභාව වෙත ගෙවා නිමකිරීමෙන් අනතුරුව පැවරුම්කරු නමින් තිබූ මගී සේවා අවසරපත්‍රය අවලංගු කර නව අංකයකින් යුත් නව මගී සේවා අවසරපත්‍රයක් ලෙසින් ගිණුම් වර්ෂය වෙනස් කිරීමකින් තොරව නව අවසරපත්‍රය නිකුත් කරනු ලැබේ.

සභාපති
ජාතික ගමනාගමන කොමිෂන් සභාව.